## ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය - 2014

---

ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහි සම්මුති පනතේ 30 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 ආයතනය පිහිටුවීම**

**-----------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහි සම්මුති පනතේ III කොටස ප්‍රකාරව ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය 2013 නොවැම්බර් මස 11 වන දින පිහිටුවන ලදී.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**-------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 09 වගන්තියට අනුව සේවා සැපයීමේදී පාවිච්චි කිරීම සඳහා හෝ බෙදා හැරීම සඳහා ද්‍රව්‍ය හෝ සැපයුම් ස්වභාවයෙන් පවතින ද්‍රව්‍ය තොග ලෙස හඳුනා ගත යුතු වුවත්, 2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ ඉතිරිව පැවති වටිනාකම රු.1,105,927 ක් වූ සාම්පල් රැස් කිරීමේ කට්ටල (Sample Kit) 188 ක් තොග ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ ප්‍රථම වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ අතිරික්තය රු.110,540 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 කාර්යසාධනය**

-----------------

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහිව සම්මුති පනතේ II වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

(i) ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටු දැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම.

(ii) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම පිළිබඳ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණ සහ නියෝජ්‍ය ආයතනය හා සමාන කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් ජාතික සංවිධාන අතර, අන්‍යෝන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදු කරන ලද පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහි සම්මුති පනතේ 33 වන වගන්තිය යටතේ රීති සම්පාදනය කර ඒවා ගැසට් පත්‍රයේ පළකිරීමෙන් අනතුරුව එම පරීක්ෂණ පැවැත්වීම, දඬුවම් ලබාදීම හා අනෙකුත් සම්බන්ධිත කටයුතු කළ යුතු වුවද, එම රීති බලාත්මක කිරීමට ආයතනය මෙතෙක් කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.2 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ගිණුම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ආයතනයේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 අගෝස්තු 31 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

---------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදයේ 02 වගන්තිය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව 2014 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ සමස්ත අයවැයගත ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂයේ සියයට 34 ක් භාවිතා නොකොට ඉතිරි වී තිබුණු අතර, ප්‍රතිපාදිත අයිතම 24 න් 15 ක සියයට 80 කට වඩා වැඩි ඉතිරියක් හා අයිතම 10 ක සියයට 100 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. තවද වැය විෂයන් 03 ක ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 70 ත් සියයට 80 ත් අතර ප්‍රමාණයක් වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා සාර්ථක කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.